ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை
National Library and Documentation Services Board
අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு Ministry of Education
14, නිදහස් මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව. 14, சுதந்திர வழி, கொழும்பு 07, இலங்கை. 14, Independence Avenue, Colombo 07, Sri Lanka
Tel: 94 11 2698847, 2685197 P.O.Box: 1764 Fax: 94 11 2685201 E-mail: info@mail.natlib.lk URL: www.natlib.lk

ඔබේ අංකය/ உமது எண்/ Your Ref :

මගේ අංකය/ எனது எண்/ My Ref :

20.03.2020

Covid-19 වෛරස ආසාදන තත්ත්වය සමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සියලු පුස්තකාල සඳහා වන පොදු උපදෙස් සංග්‍රහය

COVID-19 (කොරෝනා) වෛරස වසංගතය මැඩලීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මේ මොහොතේ රජය සහ මහජන සෞඛ්‍ය බලධාරීන් යුහුසුලුව කටයුතු කරමින් සිටී. එහෙත් අවදානම සහිත සියලු අංශ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව අපේක්ෂා කරන සාර්ථකත්වය ලබා ගත නොහැකි වනු ඇත. එහෙයින් පුස්තකාල සේවා ලාභී සියලු ජනතාව, පාඨකයින්, පුස්තකාල කාර්ය මණ්ඩලය, සහ පරිපාලකයින් මෙම අවස්ථාවේ පුස්තකාල සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීම අප ගේ වගකීම වේ.

- පුස්තකාල පොත් අතින් අත හුවමාරු වන භාණ්ඩයකි. එය කිහිප දෙනකු අතට පත් විය හැකි අතර ආසාදනයට ලක් වූ පුද්ගලයන් ද පරිහරණය කළ හැකිය. ඒවා සංසරණය මගින් COVID-19 වෛරසය ආසාදනයට සහ පැතිරීමට ඉඩක් පවතී. එහෙයින් මෙම නිරෝධායන කාලසීමාව තුළ පොදු පුස්තකාල පරිහරණයෙන් වළකින ලෙස මහජනතාවට අවවාද කෙරේ.
- පුස්තකාල කාර්ය මණ්ඩලය ද මෙහි දී ඍජු අවදානමට ලක් වේ. එහෙයින් සියලු පුස්තකාල නිරෝධායන කාලසීමාව ලෙස රජය විසින් සලකනු ලබන කාලය තුළ මහජනතාවට වසා තැබීම සුදුසු වෙයි. ආයතනයේ අනෙකුත් සේවක සේවිකාවන් සඳහා අනුදැන ඇති ක්‍රමවේදයන්ට අනුව පුස්තකාල කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ද කටයුතු කළ හැකි ය.
- පුස්තකාලය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා කිසියම් දුරකථන අංකයක් මහජනතාවට දැන ගැනීම පිණිස ප්‍රදර්ශනය කිරීම සුදුසු වෙයි.
- එසේ ම වසා ඇති කාල සීමාව තුළ එක් රැස් වන සියලු දඩ මුදල් කපා හැරීමටත්, එසේ සිදු කරන බව පොදු දැන්වීමකින් ප්‍රදර්ශනයටත් කටයුතු කිරීම මගින් සාමාජිකයන් තුළ ඒ පිළිබඳ මතු වන සැක සංකා සංසිඳවීමට ක්‍රියා කළ හැකි ය.
- එසේ ම දැනට පුස්තකාලය ස්වයංක්‍රියකරණය කර ඇති නම්, බැහැර ගෙන යාමේ කාලය අලුත් කර ගැනීමේ ක්‍රම (book renewal facilities) සහ වෙනත් මාර්ගගත සේවා ඇති නම් ඒ පිළිබඳව ද දැනුවත් කිරීම සුදුසු වෙයි.
- ඉහත සන්නිවේදන කටයුතු සඳහා මුද්‍රිත දැන්වීම් මෙන් ම පහසුකම් ඇතොත් සමාජ මාධ්‍ය සහ ඊමේල් සේවා ද යොදා ගත හැකි ය.
- පුස්තකාලය නැවත මහජනතාවට විවෘත කිරීමේ දී අනුගමනය කළ යුතු සුවිශේෂ ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරියේ දී දැනුවත් කිරීමට කටයුතු කෙරෙනු ඇත.

සොනාල ගුණවර්ධන
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

සභාපති
தலைவர்
Chairman
94 11 2685198 ch@mail.natlib.lk

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
94 11 2687581 dg@mail.natlib.lk